***සියලුම හිමිකම් ඇවිරිණි***
***All Rights Reserved***

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසට අයත් වන සාහිත්‍යමය මූලාශ්‍රයක් ලෙස ...................................... දැක්විය හැකිය.
( මහාවංශය / දීප වංශය / චූල වංශය)

02 පොළොන්නරුවේ ගල් විහාරය ........................................................................................ රජුගේ නිර්මාණයකි.
(I විජයබාහු / මහසෙන් / I පරාක්‍රමබාහු)

03 මහසෙන් රජු ජීවත් වූයේ ක්‍රිස්තු වර්ෂ ....................................................................................... දී බව පිළිගෙන ඇත.
(250 / 274 / 200)

04 බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ .......................................... ගේ උත්පත්තියට පෙර එනම් අවුරුදු 544 කට පෙරය.
(බුදුන් වහන්සේ / ක්‍රිස්තුස් වහන්සේගේ / මහමත්තුමා)

05 ක්‍රිස්තු වර්ෂයෙන් 78 දී ....................................................................................................... වර්ෂ ක්‍රමය ආරම්භ වේ.
(ශක / ක්‍රිස්තු / හිජ්රි)

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල යොදන්න.**

06 ක්‍රිස්තු වර්ෂ 622 දී ඉස්ලාම් ආගමික නායකයා මක්කම සිට මදීනා නගරයට පැමිණීම නිසා එදින සිට හිජ්රි වර්ෂ ක්‍රමය ඇරඹේ. ( )

07 පෘථිවිය සෑදෙන අවස්ථාවේ එය මහත් උණුසුමකින් පැවති අතර වර්තමානයේ එය මුළුමනින්ම සිසිල් වී ඇත. ( )

08 මහා හිම යුගයේ පැවති අධික ශීතල හා දේශගුණය මානව පරම්පරාවක ආරම්භයට හේතු විණි. ( )

09 මිනිසා බිහිවීම ආරම්භ වන්නේ දැනට අවුරුදු දශලක්ෂ දෙක හමාරකට පෙරය ( )

10 පළමු වරට පෘථිවියේ ගොඩබිම පහල වූයේ සත්ව වර්ග වේ. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11 මහා හිමයුගය පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මිනිසා බිහිවීම (2) ශාක බිහිවීම (3) සතුන් බිහිවීම (4) කෙටි උණුසුම් කාලය

12

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අවු.ද.ල. 3.8 කට පෙර A | ← | අවු.ද.ල. 2.5 කට පෙර B | ← | අවු.ද.ල. 02 කට පෙර C | ← | අවු.ද.ල. 01 කට පෙර D | ← | වර්තමානය |

ඉහත සටහනට අනුව හෝමෝ හැබිලස් හෙවත් හැකි මිනිසා බිහිවූ යුගය වන්නේ මෙයින් කවරක් ද?
(1) A (2) B (3) C (4) D

13 විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කරමින් නිවාස ඉදිකළ මානව වර්ගය වන්නේ මින් කවරෙක් ද?

(1) හෝමෝ නියැන්ඩතාලෙන්සිස් (2) ඔස්ට්‍රලෝපිතිකස්

(3) හෝමෝ ඉරෙක්ටස් (4) හෝමෝ හැබිලස්

14 අතීතයේ මිනිසා විසින් සකස් කරන ලද කාන්තා රූපයක් මෙහි දැක්වේ. එය සාදන ලද යුගය කුමක් දැයි මෙවායින් තෝරන්න.



(1) පුරා ශිලා යුගය

(2) මධ්‍ය ශිලා යුගය

(3) නව ශිලා යුගය

(4) නූතන යුගය

15 ඉහත නිර්මාණය සිදු කරන ලද්දේ මින් කවර ද්‍රව්‍යයකින් දැයි දක්වන්න.

(1) දැව (2) පාෂාණ (3) මැටි (4) සත්ව ඇට

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල A තීරුවට ගැලපෙන පිළිතුරු B තීරුවෙන් තෝරා යා කරන්න.**

| **A** තීරුව | | **B** තීරුව |
|---|---|---|
| 16 පුරා ශිලා යුගය | A | නව ශිලා යුගය |
| 17 දුනු ඊතල භාවිතය | B | ක්‍රි. පූ. 3000 |
| 18 සත්ත්ව ආහාර නිෂ්පාදනය | C | මහා හිම යුගය |
| 19 මානව පරිණාමය | D | ගුරු ගල් මගින් වර්ණ සැදීම |
| 20 මැටි දැකැත්ත | E | මධ්‍ය ශිලා යුගය |

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) පහත දැක්වෙන තොරතුරු, වගුවේ දැක්වෙන යුග තුනට ගැලපෙන ලෙස තෝරා ලියන්න.

| | |
|---|---|
| * දැව දඬු මගින් නිවාස තැනීම. | * ගම්මාන බිහිවීම. |
| * ධාන්‍ය වර්ග භාවිතය | * තැන තැන ඇවිද ආහාර එකතු කිරීම. |
| * දුණු ඊතල භාවිතය | * ගල් පර්වත මත චිත්‍ර ඇඳීම |
| * සත්ත්ව පාලනය | * ගුරුගල් වලින් වර්ණ ආලේප කිරීම. |


| A නව ශිලා යුගය | B මධ්‍ය ශිලා යුගය | C පුරා ශිලා යුගය |
|---|---|---|
| | | |
| | | |
| | | |

(ල. 8)

(2) පෘථිවියේ විවිධ වූ වෙනස්කම් සිදු වූ හෙලෝසීන යුගයේ ඇති වූ නව දේශගුණික ලක්ෂණ 02 ක් දක්වන්න. (ල. 4)

(3) අතීතයේ දඩයමින් ජීවත් වූ මිනිසා ගොවිතැන් කිරීමට හුරු පුරුදු වීමෙන් ඇති වූ ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 4)

02. (1) ඉතිහාසය ඉගෙන ගැනීමට ඉවහල් වන මූලාශ්‍රය අනුව පහත සටහන සම්පූර්ණ කරන්න (ල. 4)




(ල. 7)

(2) ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන 2 ක් දක්වා ඒවා ඔබගේ ජීවිතයට අදාල කර ගන්නේ කෙසේ දැයි දක්වන්න. (ල. 4)

03 (1) පහත දක්වෙන A තීරුවේ සිදුවීම් ක්‍රිස්තුවර්ෂ හා බුද්ධ වර්ෂ අනුව B තීරුවේ දක්නට ඇත. ඒවා ගැලපෙන පරිදි යාකරන්න.

| | A තීරුව | | B තීරුව |
|---|---|---|---|
| 1. | බුදුන් වහන්සේගේ පරිනිර්වාණය | A | බුද්ධ වර්ෂ 01 |
| 2. | වසභ රජු රජ වීම | B | බුද්ධ වර්ෂ 818 |
| 3. | බුදුන් වහන්සේ ගේ පරිනිර්වාණය | C | බුද්ධ වර්ෂ 544 |
| 4. | මහසෙන් රජතුමා රජ වීම | D | ක්‍රිස්තු පූර්ව 544 |
| 5. | ක්‍රිස්තුන් වහන්සේ ගේ උපත | E | බුද්ධ වර්ෂ 611 |

(ල. 5)

(2) පුරා විද්‍යාත්මක කැණීම් මගින් පැරණි ඉතිහාසය පිළිබඳ තොරතුරු දැනගැනීමට හැක්කේ කෙසේ ද? (ල. 3)

(3) පෘථිවිය සෑදෙන අවස්ථාවේ එය දැඩි උණුසුමකින් පැවති බවට සාධක එකක් ලියන්න. (ල. 3)



04 (1) මෙම රූපයේ දක්වෙන්නේ කුමන යුගයකට අයත් නිර්මාණයක් ද? (ල. 2)

(2) එය නිර්මාණය කරන ලද්දේ මීට වසර කීයකට පෙර ද? (ල. 2)

(3) මෙය සෑදීම සඳහා භාවිතා කළ ද්‍රව්‍යය දක්වන්න. (ල. 2)

(4) මෙවැනි දෑ නිර්මාණය දක්වා මිනිසා ගේ විකාශය පිළිබඳව පියවර 5 ක් මෙහි දක්වා ඇත. එය කාලය අනුව පිළිවෙලින් සකස් කරන්න.

| | | | |
|---|---|---|---|
| A | ගින්දර සොයා ගැනීම | B | හැඟීම් ප්‍රකාශ කිරීමට සංගීතය |
| C | අදහස් හුවමාරු කර ගැනීමට භාෂාව | D | ආහාර පුලුස්සා ගැනීම |
| E | ආහාර පිසීම | | |

(ල. 5)

05. (1) පුරා ශිලා යුගයේ මිනිසුන් පිළිබඳව ඔබ ඉගෙන ගත් තොරතුරු අනුව පහත තොරතුරු සඳහා කරුණු දෙක බැගින් දක්වන්න.

A අවමංගල චාරිත්‍ර B පවුලේ ස්වභාවය C ආහාර පුරුදු D නිර්මාණ (ල. 8)

(2) නවශිලා යුගයට අයත් පහත සඳහන් තොරතුරු සඳහා කරුණු එක බැගින් ලියන්න.

A - මිනිස් කටයුතු B - ආහාර C - නිවාස (ල. 3)


06. (1) දී ඇති උපකාරක පද ඇසුරින් පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

**හරහට**

1. මේවා සොයාගැනීම නිසා පැරණි මිනිසා නව යුගයකට එක්විණි.
2. ක්‍රිස්තු වර්ෂ ආරම්භයට මුල් වූ ආගමික නායකයෙකි.
3. හින්දු දින දර්ශනයට අයත් වර්ෂයකි.
4. පළමුවරට ගින්දර භාවිතයට සම්බන් රට වේ.
5. ඉස්ලාම් ආගමික නායක තුමා මදීනා නගරයට පැමිණියේ මෙහි සිටය.

**පහළට**

1. අප සැම අයත්වන මානවයා මේ නමින් හැඳින්වේ.
2. භාෂාව භාවිතා කරන්නේ මේවා හුවමාරු කර ගැනීමටය.
3. අතීත තොරතුරු දැනගත හැකි ලිඛිත මූලාශ්‍රයකි.




(ල. 08)

(2) ආදි මිනිසාට ගොවිතැන ආරම්භවීමෙන් පසුව අත් වූ වාසි 3 ක් දක්වන්න. (ල. 03)

07.



A



B



C



D

(1) හෝමෝ සාපියන්වරු ලෙස බිහිවූ අතීත මිනිසා ගේ නම් ඉහත A B C D වලින් දැක්වෙන පින්තූර හඳුනාගෙන නම් කරන්න. (ල. 4)

(2) ඔවුන් බිහිවූ රටවල් 1 බැගින් නම් කරන්න. (ල. 4)

(3) අතීත මානවයින් ක්‍රමිකව වෙනස් වීමෙන් වර්තමාන මිනිසා දක්වා පරිවර්තනය වීමේ දී මුලින්ම බිහිවූ ඔස්ට්‍රලෝපිතිකස් ගෙන් පසුව බිහි වූ මානව වර්ග 3 සඳහන් කරන්න. (ල. 3)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. දීප වංශය 02. I පරාක්‍රමබාහු 03. 274 04. ක්‍රිස්තුස් වහන්සේ 05. ශාක 06. (✓) 07. (✗)
08. (✓) 09. (✓) 10. (✗) 11.(2) 12. (3) 13. (1) 14. (1) 15. (4) 16. (D)
17. (E) 18. (A) 19. (C) 20. (B) (2 x 20 = ල. 40)

## II කොටස

01. 1. A - තැන තැන ඇවිද ආහාර එකතු කිරීම ගුරු ගල් වලින් වර්ණ ආලේප කිරීම
B - දුනු ඊතල භාවිතයේ ගල් පර්වත මත චිත්‍ර ඇඳීම.
C - ගම්මාන පිහිටීම, ධාන්‍ය වර්ග භාවිතය, සත්ව පාලනය.
2. උණුසුම් දේශගුණයක් බිහිවීම, ශීතල අඩුවීම, පරිසරය උණුසුම් වීම (ල. 4)
3. • සතුන් දඩයම අඩුවීම • වාසස්ථාන ඉදිවීම • පවුල බිහිවීම • ගම්මාන ඇතිවීම • වී වගාව (ල. 2)

02. 1. (1) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර (2) ජන කථා (3) මහාවංශය (4) ක්‍රි. ව. 4 වන සියවස
(5) මහානාම හිමි (6) ක්‍රි.ව. 12 වන සියවස (7) I පරාක්‍රමබාහු රජු (ල. 7)
(ල. 7)
2. • වර්තමානය යහපත් කර ගැනීමට උපකාර කර ගැනීම • පරිසර දූෂණයෙන් තොර ගොවිතැන
• අසාර්ථක අවස්ථා හඳුනා ගැනීම • අනාගතය දියුණු කර ගැනිමට උපකාර වීම. ආදිය ..... (ල. 4)

03. 1. A 2. B 3. D 4. B 5. C (ල. 5)
2. පොළොව හෑරීම තුලින් අතීතයේ භාවිතා කල දෑ හඳුනාගැනීම තුළිනි. (ල. 3)
3. • පෘථිවියේ මැද කොටස තවමත් අධික උණුසුමකින් පැවතීම (ල. 3)

04. 1. පුරා ශිලා යුගය (ල. 2) 2. වසර තිස් දහසකට පෙර යුගය (ල. 2)
3. සත්ව ඇටකටු (ල. 2) 4. A, D, B, C, E (ල. 5)

05. 1. සුදුසු පරිදි කරුණු දැක්වීමට (ල. 08)
2. අදාල කරුණු දැක්වීමට - (ල. 3)

06. (1) **හරහට** 1. ගින්දර 2. ක්‍රිස්තුස් වහන්සේ 3. ශාක 4. ඊශ්‍රායලය 5. මක්කම
**පහළට** 1. හෝමෝ සාපියන් 2. අදහස් 3. මහා වංශය (ල. 08)
(2) ධාන්‍ය වර්ග භාවිතය / ගොවි උපකරණ නිෂ්පාදනය / අධික අස්වනු ලබාගැනීම / ශිෂ්ඨාචාර තනාගැනිමේ හැකියාව (ල. 03)

07. 1. A - කෝකසොයිඩ්
B - නීග්‍රොයිඩ්
C - ඔස්ට්‍රලොයිඩ්
D - මොන්ගොලොයිඩ් (ල. 4)
2. A - ඇමෙරිකාව, ග්‍රීන් ලන්තය
B - අප්‍රිකාව
C - ආසියාව, ඉන්දියාව
D - ජපානය, චීනය (ල. 4)
3. හොමෝ හැබිලස්, හෝමෝ ඉරෙක්ටස්, හොමෝ නියැන්ඩකාලෙන්සිස් (ල. 3)